**A message of solidarity to our student community at the Faculty of Management Studies and Commerce, University of Sri Jayewardenepura**

Dear Students,

The world today, as one, is experiencing a massive wave of uncertainty at the hands of COVID-19, and we at the Faculty of Management Studies and Commerce, University of Sri Jayewardenepura, Sri Lanka, stand in solidarity with each and every person, family, city and nation that is severely affected by this pandemic, and share their grief as we all pass through these testing times.

The FMSC, as you are aware has been in the practice of working tirelessly to ensure that our students graduate on time; however, given this unprecedented crisis we had to take a vital step back in order to protect each other and our community. Therefore, I'd firstly wish to reassure you that your academic activities will remain a priority for us and that we will take all measures necessary in order to ensure that this disruption has minimal effect over your respective degree programmes. Therefore, do not allow yourselves to worry in this regard, and rest assured that we will get back on track once the tide settles down. In the meantime, if you're facing difficulties (economic or otherwise) due to prevalent situation in the country, do not hesitate to contact your respective Head of the Department or if you're a first-year student, the Common Programme Coordinator; and we will then assist you to the best of our capacity.

Having said that, I wish to highlight that the need of this hour is your safety and the safety of those around you. Therefore, while you respect the measures that have been put in place for the safety of our nation and coorporate by taking necessary precautions, I urge you to employ this period in order to engage in a broader sense of education; perhaps by learning a new skill, cultivating your own garden and cleaning your surroundings, reading on topics that interest you beyond course work (you may access the library and other eBooks that have been available to do so), practicing activities that would help you in remaining strong both mentally and physically, and so on. Further, as a university student, I hope that this period would allow you to take up leadership and add value to your family and if possible, your community.

COVID-19 has given you the gift of freedom and time, both which you complained of not having enough before. So, use it wisely - to explore yourself and to strengthen relationships with your loved ones, for this opportunity may never be yours again.

Wishing you, your loved ones, and communities good health.

Dr. U. Anura Kumara
Dean
Faculty of Management Studies and Commerce

## ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ ශිෂ්‍ය ප්‍රජාව වෙත පීඨාධිපතිගේ පණිවුඩය

දයාබර සිසුවනි,

මුළු මහත් ලෝකයම අද වන විට කෝවිඩ්-19 තත්වය නිසාවෙන් ඉතා විශාල අවිනිශ්චිතතාවයක් අත්දකිමින් සිටිනා අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය ලෙසට අපි මේ මොහොතේ මෙම තත්වයෙන් පීඩා සහ වේදනා විඳිනා සියළුම දෙනා සමඟ මෙම වේදනාව බෙදාගන්නෙමු. මෙම තත්වයෙන් අසරණ වී සිටිනා සෑම පුද්ගලයෙක්ම, සෑම පවුලක්ම, සෑම නගරයක්ම ගමන් කරන වේදනාව සමඟ අපි මේ මොහොතේ ඒකාත්මික වන්නෙමු.

ඔබ සියළු දෙනා දන්නා පරිදි,  කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය, තම සිසුන් නියමිත කාලය තුළ උපාධිය ලබාගැනීම පිළිබඳව ඉතා ඉහළ සැලකිල්ලක් දක්වන අතර එය ළඟා කරගැනීම වෙනුවෙන් ඉතා වෙහෙස වී, නොනවත්වා වැඩෙහි යෙදී ඇත්තෙමු. නමුත්, මෙම අර්බුදකාරී තත්වය හමුවේ, අන් සියළු අරමුණු පසෙකලා, අප සමාජය රැක ගැනීම උදෙසා පියවරක් පසුපසට තැබීමට අපට සිදුව තිබේ. නමුත් මේ මොහොතේද මා ඔබට අවධාරණය කරනු ලබනුයේ, ඔබගේ අධ්‍යයන කටයුතු නිසි පරිදි කරගෙන යෑම උදෙසා අපි නොන්වත්වා වැඩෙහි යෙදෙන බවත්, මෙම අර්බුදකාරී තත්වයෙන් ඔබේ අධ්‍යයන කටයුතු සඳහා වන බලපෑම අවම කිරීමට අපට ගත හැකි සියළු ක්‍රියාමාර්ගයන් අප ගන්නා බවත්ය. එම නිසාවෙන් ඔබට මඟ හැරෙනවා යයි ඔබ සිතනා කාලය පිළිබඳව කණගාටු නොවන ලෙසට අපි ඔබෙන් ඉල්ලා සිටිනා අතර නැවත සියල්ල යථා තත්වයට පත් වූ වහාම ඔබගේ අධ්‍යයන කටයුතුද නිසි පරිදි සිදුවනු ඇත. ඒ අතරම, මෙම තත්වය නිසා ඔබ කුමන හෝ අපහසුතාවයක් හරහා ගමන් කරන්නේ නම් ( මූල්‍යමය වශයෙන් හෝ අන් කවර ආකාරයකින් වුවද) ඔබගේ දෙපාර්තමේන්තු ප්‍රධානී ආචාර්යවරයා සමඟ සම්බන්ධ වීමට දෙවරක් නොසිතන්න.ඔබ පළමු වසර සිසුවෙකු නම්, පොදු පාඨමාලා සමායෝජක (සම්බන්ධීකාරක) හා සමඟ සම්බන්ධ වන ලෙස අපි ඔබෙන් ඉල්ලා සිටිමු. මේ අසීරු අවස්ථාවේදී අප ශක්ති ප්‍රමාණයේ උපරිමයෙන් ඔබ වෙනුවෙන් වැඩෙහි යෙදීමට අපි උත්සහ ගන්නෙමු.

එමෙන්ම, මේ මොහොතේ ඔබ සහ ඔබ අවට සිටින සියල්ලන්ගේ ආරක්ෂාව පිළිබඳව අවධානය යොමු කිරීමට ඔබට පැවරී ඇති වගකීම පිළිබඳව ඔබට සිහිපත් කිරීමට මම කැමැත්තෙමි. ඒ අනුව, මේ මොහොත වන විටත් මෙම තත්වය පාලනයට රජය සහ අදාළ අංශ විසින් ගෙන ඇති සියළු ක්‍රියාමාර්ග පිළිපදිමින්, ඒවාට අවනත වී තමන්ගේ ආරක්ෂාව සලසා ගන්නා අතර පොදු සමාජ වගකීම පිළිබඳවද අවදියෙන් යුතුව ක්‍රියා කරන ලෙස ඔබෙන් ඉල්ලා සිටින්නෙමු. මෙම මොහොත අධ්‍යාපනය පිළිබඳව නව සහ වඩාත් පුළුල් මානයකින් සිතන්නට මම ඔබට ආරාධනා කරන්නෙමි. ඔබගේ නව හැකියාවක් වර්ධනය කර ගැනීම, අප ඉදිරියේ ඇති අනෙක් අභියෝගය වන ඩෙංගු රෝගයෙන් ආරක්ෂා වෙනු පිණිස ඔබේ ගෙවත්ත සහ නිවස පිරිසිදු කිරීම, හැකි පමණින් වගා කිරීම, අන්තර්ජාලය පරිහරණය කොට ඔබේ උපාධි පාඨමාලාවට අදාළ දැනුම පිළිබඳව නව මානයන් අධ්‍යනය ( විශ්වවිද්‍යාල පුස්තකාලයේ ඇති ඊ-බුක්ස් භාවිතාව සහ ඔබේ පාඨමාලාවලට අදාළ ඊ-බුක්ස් සහ පර්යේෂණ පත්‍රිකා පරිහරණය) වැනි දෑ මෙන්ම ඔබට ශාරීරිකව මෙන්ම මානසිකවද සවිමත්ම මේ මොහොත ගත කිරීමට හැකියාව ලැබෙන වෙනත් ක්‍රියාකාරකම් වල නිරත වීම ද එක ලෙසට වැදගත් වනු ඇත. එමෙන්ම විශ්වවිද්‍යාල සිසුවෙකු/සිසුවියක ලෙසට මෙම අසීරු මොහොත තුළදී, ඔබේ පවුලට සහ ඔබ අවට සමාජයට නායකයෙකු වීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත. ඔබ එම අස්වථාව වගකීමකින් යුතුව වැඩෙහි යොදවනු ඇතැයි මා බලාපොරොත්තු වෙමි.

ඔබ මීට පෙර ඔබ සතු නොවූ බවට පැමිණිලි කරමින් තිබූ නිදහස සහ කාලය, කෝවිඩ්- 19 විසින් ඔබට ලබා දී තිබේ. එය ප්‍රඥාවන්ත ලෙස භාවිතා කොට ඔබව සහ ඔබේ අනන්‍යතාවය සොයාගැනීමටත්, ඔබේ ආදරණීයයන් හා සමඟ ඔබේ සබඳතා සවිමත් කරගැනීමටත් භාවිතා කරනු ඇතැයි මා සිතනුයේ අපට නැවතත් මෙවැනි අවස්ථාවක් නොලැබී යා හැකි බැවිනි.

ඔබටත්, ඔබේ ආදරණීයයනටත්, සමස්ත සමාජයටත් සුවදායක සෞඛ්‍ය තත්වයක් ප්‍රාර්ථනා කරමි.

ආචාර්ය යූ. අනුර කුමාර
පීඨාධිපති
කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨය